# මාධ්‍ය නිවේදනය
## කාර්මික නිෂ්පාදන දර්ශකය : 2018 ජනවාරි
### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011 - 2147401** **ෆැක්ස්: 011-2147412** **2018 මාර්තු 14**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි මාසය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2017 වර්ෂයේ ජනවාරි මස නිෂ්පාදනයට සාපේක්ෂව, 2018 ජනවාරි මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි, කාර්මික නිෂ්පාදන දර්ශකයේ 4.3% ක වැඩිවීමක් වාර්තා වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා ප්‍රකාශ කළේ ය. තව ද 2018 සහ 2017 යන වර්ෂවල ජනවාරි මස මෙම දර්ශකය පිළිවෙලින් 108.9 ක් සහ 104.4 ක් විය.

කාර්මික නිෂ්පාදන දර්ශකය ද ඇතුළත්ව ආර්ථික දර්ශකාංක ගණනාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබේ. මෙම දත්ත ආර්ථිකයේ ප්‍රවණතා හඳුනා ගැනීමට, ආර්ථික වර්ධනය මෙහෙයවන ප්‍රධාන අංශ හඳුනා ගැනීමට හා ආර්ථික ක්‍රියාකාරිත්වය ඇගයීමට වැදගත් වේ. කාර්මික නිෂ්පාදන දර්ශකය මඟින්, දෙන ලද කාල පරිච්ඡේදයක දී ආර්ථිකයේ කර්මාන්ත අංශයෙහි ස්වරූපය පිළිබඳ හඳුනා ගැනීම සිදු කෙරේ. තව ද මෙමඟින් කර්මාන්ත අංශයේ කෙටි කාලීන වෙනස්කම් ද හඳුනා ගත හැකිය.

නිෂ්පාදන කර්මාන්ත සැලකීමේ දී නිෂ්පාදන කාණ්ඩ 20ක් අතුරින් නිෂ්පාදන කාණ්ඩ 11ක්ම 2017 ජනවාරි මසට සාපේක්ෂව ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අතරින්, 'අඟුරු නිෂ්පාදනය සහ ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව', 'පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන' සහ 'යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදන ' වල පිළිවෙලින් 38.4%, 24.4% සහ 16.7% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ. තව ද, 2018 ජනවාරි මස මූලික ලෝහ නිෂ්පාදන අංශයෙහි 11.2% ක වැඩි වීමක් ද ආහාර නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය 3.5% ක වැඩිවීමක් ද වාර්තා වේ.

**කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)**

| මාසය / වර්ෂය | දර්ශක අගය |
|---|---|
| 2017 ජනවාරි | 104.4 |
| 2018 ජනවාරි | 108.9 |
| | |
| ප්‍රතිශතක වෙනස (%) 4.3 | |

ඍණාත්මක වර්ධනයක් පෙන්නුම් කළ නිෂ්පාදන කාණ්ඩ 9 අතුරින්, 'ඖෂධ නිෂ්පාදන', 'ගෘහ භාණ්ඩ නිෂ්පාදන' සහ 'කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන' වල 2017 වර්ෂයේ ජනවාරි මස නිෂ්පාදනයට සාපේක්ෂව පිළිවෙලින් 22.2%, 21.1% සහ 18.8% ක අඩුවීමක් වාර්තා විය.

මේ පිළිබඳව වැඩි විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තව දුරටත් දන්වා සිටී. ( www.statistics.gov.lk/Industries)